ඇමුණුම IV

GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

14/06/2012

# පුවත්පත් නිවේදනය

## වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතාට එරෙහිව පලවූ අසත්‍ය පුවත නිවැරදි කිරීම සම්බන්ධවයි

**"මැතිවරණ ප්‍රචාරන කටයුතු සඳහා පැමිණි වෛද්‍ය පාදෙනියව ජාතික රෝහලෙන් පන්නයි"** යන මැයින් 22/05/2012 දින දිනපතා දිවයින පුවත්පතේ පලකර තිබූ ප්‍රකාශය සම්බන්ධව නිවැරදි කරණ ලද ප්‍රවෘත්තිය මෙසේ වේ.

කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ සේවයේ නියුතු විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතා නිතර විවිධ අවශ්‍යතා සඳහා කොළඹ ජාතික රෝහලට පැමිණෙන බවත් එවැනි කිසිදු අවස්ථාවකදී එතුමාට ඉහත සඳහන් ආකාරයේ විරෝධයක් ජාතික රෝහලේ වෛද්‍යවරුන්ගෙන් ඉදිරිපත් වී නැති බවත් දන්වනු කැමැත්තෙමු . බොහෝ අවස්ථාවලදී වෘත්තිමය කරුණු සම්බන්ධව අප සංගමයේ සභාපතිවරයා ලෙස එතුමා වෛද්‍යවරුන් සමග අදහස් හුවමාරු කරගන්නා අතර මැයි 19 වන දා හෝ වෙනයම් කිසි දිනයකදී හෝ ඉහත පුවතේ ඉදිරිපත් කර ඇති ආකරයෙන් වෘත්තිය ගෞරවයට හානිවන පරිද්දෙන් කලහකාරී ලෙස ජාතික රෝහලේ වෛද්‍යවරුන් කිසිවිටකත් ක්‍රියා නොකල බවත් මෙවන් අසත්‍ය පුවතක් ප්‍රසිද්ධ කිරීම ජාතික රෝහලේ වෛද්‍යවරුන්ට පමණක් නොව සමස්ත වෛද්‍ය ප්‍රජාවේම ගෞරවයට හානිකර බවත් අපගේ හැඟීමයි.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්